# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වෛද්‍ය (සංශෝධන)

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් 2024 ජූලි මස 02 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මැයි මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[268 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි යම් කාරණා කිහිපයක් අලුතින් ඇතුළත් කරනු ලබයි.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඇ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 19ඇ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් වෛද්‍ය සභාව විසින් සිදු කරනු ලබන යම් නිර්දේශයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත උපදෙස් ලබාදීම සඳහා කමිටුවක් පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඉ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් "යම් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක්" යන යෙදුම වඩාත් පැහැදිලිව ප්‍රකාශ කරනු ලබයි.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2 වන වගන්තිය මගින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.-ඕ. 2/2024

## (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක      දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

105 වන අධිකාරයේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඊ) ඡේදයේ "අවම තත්ත්වයන් පවත්වාගෙන යාම." යන වචන වෙනුවට "අවම තත්ත්වයන් පවත්වාගෙන යාම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ඊ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන්:-

"(උ) පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පවත්වනු ලබන යම් උපාධි පාඨමාලාවකට අදාළ වන යම් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් පිළිගනු ලැබීම හෝ පිළිගනු ලැබීම අලුත් කිරීම පිළිබඳ නිර්ණායක;

(ඌ) යම් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් පවත්වනු ලබන යම් උපාධි පාඨමාලාවකට අදාළ වන වෛද්‍ය විද්‍යා සුදුසුකමක් පිළිගනු ලැබීමේ දී යම් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම සහ වර්ගීකරණය කිරීම පිළිගනු ලැබීමේ නිර්ණායක;

(එ) යම් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් උපාධිවලට අදාළ වන යම් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් අනුමත කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය; සහ

(ඒ) යම් විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබාගත් යම් උපාධියකට අදාළ වන යම් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් දරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය වෘත්තියේ හෝ දන්ත වෛද්‍ය වෘත්තියේ නියැලීම සඳහා වන යම් පරීක්ෂණයක් සම්බන්ධයෙන් වන කොන්දේසි සහ ඇගයීමේ නිර්ණායක.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඇ වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

“(2අ) (2) වන උපවගන්තිය යටතේ යම් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් විසින් සිදු කරන ලද යම් අදහස් දැක්වීමක් තමා වෙත ලැබුණු විට, අමාත්‍යවරයා විසින් එම අදහස් දැක්වීම, (1) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් සිදු කරන ලද නිර්දේශය සමඟ පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් වෙත යොමු කළ යුතු ය:-

(අ) සෞඛ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා (වෛද්‍ය සේවා);

(ආ) සෞඛ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, සෞඛ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් ඇති මහාචාර්යවරුන් තිදෙනෙක්;”

(2) එහි (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(3) (1) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් සිදු කරන ලද නිර්දේශය සහ (2) වන උපවගන්තිය යටතේ යම් පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් විසින් අදහස් දක්වන ලද්දේ නම්, ඒ අදහස් පරීක්ෂා කිරීමෙන් පසුව සහ (2අ) උපවගන්තිය යටතේ පත් කරන ලද කමිටුව විමසා -

(අ) වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතු වන පරිදි ඒ විශ්වවිද්‍යාලය විසින් හෝ ආයතනය විසින් සපයනු ලබන අධ්‍යයන පාඨමාලාව;

(ආ) ඒ සුදුසුකම ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම සඳහා ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් පවත්වනු ලැබූ පරීක්ෂණවල දී දැක්විය යුතු නියමිත ප්‍රවීණතා මට්ටම;

(ඇ) ඒ අධ්‍යයන පාඨමාලාව සඳහා ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් සපයනු ලැබ ඇති කාර්ය මණ්ඩලය, උපකරණ, ඉඩ පහසුකම් හා පහසුකම්,

නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින්, ඒ සුදුසුකම දරන තැනැත්තාට මේ ආඥාපනත යටතේ ලියාපදිංචි වීමට හැකි කරන මේ ආඥාපනතේ යම් විධිවිධානයක් එම විශ්වවිද්‍යාලය හෝ ආයතනය සම්බන්ධයෙන් නැතහොත් එවැනි විශ්වවිද්‍යාලයකට අනුබද්ධ යම් ආයතනයක් සම්බන්ධයෙන් බලාත්මකව පැවතීම එම නියමයේ නිශ්චිතව දැක්වෙන යම් දිනයක දී සිට අවසන් විය යුතු යයි ප්‍රකාශයට පත් කළ යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඉ වගන්තිය, එහි "පිළිගත් විශ්වවිද්‍යාලය හෝ ආයතනය" යන යෙදුමේ අර්ථනිරූපණයේ "යම් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක්" යන වචන වෙනුවට "යම් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් හෝ එකී විශ්වවිද්‍යාලයට අනුබද්ධ යම් ආයතනයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19ඉ වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ, (ආ) (ii) (ආආ) ඡේදයේ "වගන්තියේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියේ (ආ) (iv) (ආආ) (i) ඡේදයේ "වගන්තියේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (2) වන උපවගන්තියේ (ආ) (iii) (ආආ) (i) ඡේදයේ "වගන්තියේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (2) වන උපවගන්තියේ (ආ) (iii) (ආආ) (ii) ඡේදයේ "වගන්තියේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

**6.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව